# පුස්තකාල ප්‍රවෘත්ති

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

**අපේ නව ලිපිනය**

අධ්‍යක්ෂ,
ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ගොඩනැගිල්ල,
නිදහස් මාවත,
කොළඹ 7. ටැලි: 98847

**LIBRARY NEWS** නූලகச் செய்தி

● පළමුවැනි කාණ්ඩය ● අංක 4 Volume I No, 4


## දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීමේ

# පාඨ මාලාවක්

**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීමේ පාඨ මාලාවක් 1981 මාර්තු මස නවවන දින සිට දහනවවන දින දක්වා කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේදි පැවැත්වීමට කටයුතු යොදා තිබේ.**

ශ්‍රී ලංකාවේ ඇති සියලුම දිස්ත්‍රික්කවල ප්‍රධාන පුස්තකාල සංවර්ධනය කරලීමටත්, ඒවා කේන්ද්‍රීය කොටගෙන ඒ වටා ඇති කුඩා පුස්තකාල සංවර්ධනය කිරීමෙත් පළමු පියවර වශයෙන් මෙම පාඨ මාලාව සංවිධානය කර ඇත.

මෙම පාඨ මාලාව සඳහා දිස්ත්‍රික් විසිහතරෙන් පුස්තකාලයාධිපතීන් හතලිහක් පමණ තෝරාගෙන ඇත.

පාඨ මාලාව විවෘත කිරීම ගරු අධ්‍යාපන සේවා අමාත්‍ය ලයනල් ජයතිලක මහතා අතින් සිදු කිරීමට නියමිතය. එදින පැවැත්වෙන ප්‍රධාන සම්මන්ත්‍රණය සඳහා දිවයිනේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන්, තෝරා ගත් පුස්තකාල භාර ප්‍රදේශයේ පළාත් පාලන ආයතන ප්‍රධානීන්ද සහභාගි වේ.

සති දෙකක් පුරා පැවැත්වෙන මෙම පාඨ මාලාවේ දේශන සහ සාකච්ඡා මෙහෙයවනු ලබන්නේ පුස්තකාල ක්ෂෙත්‍රයේ ප්‍රවීන දේශකයින් විසිනි.

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමයේ වර්ධනය සහ වර්තමාන දිස්ත්‍රික් පාලන ක්‍රමය යන මැයෙන් පළාත් පාලන සේවා අධ්‍යක්ෂ බී. ලියනමාන මහතා විසින් පාඨ මාලාවේ පසුබිම් දේශනය පවත්වනු ලබයි.

පාඨ මාලාව අවසානයේ එහිදී කරනු ලබන දේශන ලිපි සංග්‍රහයක් වශයෙන් මහජන පුස්තකාලයාධිපතිවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පොතක් වශයෙන් පළ කිරීමටද මණ්ඩලය අපේක්ෂා කරයි,

මෙම පාඨ මාලාව පැවැත්වීමට ආසියා පදනමේ සහාය ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට ලැබී ඇත.

## නව සභාපති ධුරයට එම්. ජේ. පෙරේරා මහතා පත්වෙයි

අධ්‍යාප න අමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ නව සභාපතිවරයා හැටියට එම්- ජේ. පෙරේරා මහතා පසුගිය පෙබරවාරි මස සිට පත් කර ඇත.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ඉතිහාසය දෙස බලන කල යුනෙස්කෝ විශේෂඥ හැරල්ඩ් වී. බොනි මහතා ශ්‍රී ලංකාවේ පුස්තකාල සේවා පිළිබඳ සැපයූ විශේෂ වාර්තාවෙහි ජාතික පුස්තකාලයක් පිහිටුවීම සහ දිවයිනේ පුස්තකාල සේවා උදෙසා මධ්‍යගත ආයතනය වශයෙන් ජාතික පුස්තකාල සේවා මණ්ඩලයක් පිහිටුවීම පිළිබඳ යෝජනාව ඉදිරිපත් කළේ එම්. ජේ. පෙරේරා මහතා සංස්කෘතික අධ්‍යක්ෂ ධුරය දරණ සමයේදී ය.

මෙහි ප්‍රතිඵලය වූයේ ඒ මහතා අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් කටයුතු කළ කාලයේදී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පණත සකස් වීම සහ 1970 දී අයි. එම් ආර්. ඒ. ඊරියගොල්ල ඇමතිතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමත කරවා ගැනීමත් ය.

එමෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පිහිටුවන්ට යෙදුනේ ද ඒ මහතා සංස්කෘතික අධ්‍යක්ෂ ධුරය දරූ සමයේදී ය.

## ශ්‍රී ලංකාවේ දුර්ලභ ග්‍රන්ථ නැවත මුද්‍රණය වේ!

ශ්‍රී ලංකාවට අදාලව කලා ඉතිහාසය, මානව විද්‍යාව, සාහිත්‍යාංග ආදී විෂයයන් අළලා මීට අවුරුදු 40 කට හෝ 50 කට පෙරාතුව ලියන ලදුව, එම විෂයයන් පිළිබඳව දැනට තොරතුරු ලබා ගත හැකි එකම මාර්ගය වශයෙන් පවත්නා ඒක විෂයක ග්‍රන්ථ හා පොත්පත් බොහොමයක්ම දීර්ඝ කාලයක පටන්ම නැවත මුද්‍රණය කරනු නොලැබී පවතී.

පුස්තකාල ඉතා ස්වල්පයක පමණක් හැරෙන්නට මෙවැනි පොත්පත් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන විද්වතුන්ගේ පරිශීලනය සඳහා ශ්‍රී ලංකාවේ අන් කිසිම ස්ථානයකින් ලබා ගත නොහැකි තත්වයක් අද උද්ගතවී තිබේ.

මෙම බුද්ධි විෂයක අවශ්‍යතාවය සපුරාලනු වස් විශේෂ කොට රජය මගින් ප්‍රකාශයට පමුණුවන ලද ග්‍රන්ථද ඇතුළු එවැනි කෘතීන් තෝරා නැවත ඒවා මුද්‍රණය කරවීමේ වැඩ පිළිවෙලක් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කොට තිබේ.

සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලැබූ විශේෂ කාරක සභාවක් විසින් එවැනි ග්‍රන්ථ නැවත මුද්‍රණය කරවීම පිණිස තෝරාගනු ලබන අතර මෙම කාරක සභාවට පුරාවිද්‍යා කොමසාරිස්, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, සංස්කෘතික අමාත්‍යාංශයේ සහ රාජ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයින්, රජයේ මුද්‍රණාලයාධිපති සහ ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂද ඇතුලත් වේ.

1974 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම වැඩ සටහන නොකඩවාම කරගෙන යනු ලැබේ. එම වැඩ සටහන මගින් මේ දක්වා පහත දැක්වෙන විරල ග්‍රන්ථ නැවත මුද්‍රණය කරවනු ලැබ ඇති අතර, කොළඹ කෞතුකාගාරයේ පොත්හල, මහනුවර ජාතික කෞතුකාගාරය, රත්නපුර ජාතික කෞතුකාගාරය සහ අනුරාධපුර ගැමි කෞතුකාගාරය යන ස්ථානවලින් ඒවා මිලදී ගත හැකි බව දක්වා ඇත.

3 වැනි පිටුවට

## කොළඹ මහජන පුස්තකාලය නව මන්දිරයක

පසුගිය දෙසැම්බර් මස 17 වනදා කොළඹ මහජන පුස්තකාලයේ නව ගොඩනැගිල්ල ශ්‍රී ලංකා ජනාධිපති ගරු ජේ. ආර්. ජයවර්ධන උතුමාණන් සහ අග්‍රාමාත්‍ය ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමා විසින් උත්සව ශ්‍රීයෙන් විවෘත කරන්නට යෙදුනි.

මහල් තුනකින් සමන්විත මෙම නව ගොඩනැගිල්ලේ වර්ග අඩි ලක්ෂයක පමණ ඉඩකඩ ඇත. ඉතාමත් දැකුම්කළු අන්දමට නිමවන ලද මෙම පුස්තකාල ගොඩනැගිල්ල දැනට ආසියාවේ ඇති හොඳම මහජන පුස්තකාල ගොඩනැගිලිවලින් එකක් බවට පත්වී ඇත.

නවීන මහජන පුස්තකාලයකින් ලබා ගත හැකි පුළුල් සේවාවක් ලබා දීම සඳහා අවශ්‍ය අංශ රාශියක් නව පුස්තකාල ගොඩනැගිල්ලේ දක්නට පිළිවන. තොරතුරු සේවා ඒකකය, ප්‍රදර්ශන ශාලාව, බැහැර දෙන පුස්තකාලය, පුවත්පත් හා වාර සඟරා කාමරය, ළමා පුස්තකාලය, ජංගම පුස්තකාල සේවා අංශය, අධ්‍යායනාගාරය, සම්මන්ත්‍රණ ශාලාව, ඡායා පිටපත් අංශය, ශ්‍රව්‍ය දෘෂ්‍ය පුස්තකාල අංශය, ශ්‍රවනාගාරය, විමර්ශන අංශය යන ආදී අංශවලින් මෙය සමන්විත වේ,

3වැනි පිටුවට

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - කොළඹ.



## ● පුස්තකාල ගොඩනැගිලි විශේෂඥයා යලි පැමිණෙයි

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ගොඩනැගිල්ල සැලසුම් කළ ගෘහ නිර්මාණ ශිල්පී මහාචාර්ය මයිකල් බ්‍රෝන් මහතා පසුගිය ජනවාරි මස අග භාගයේ දී කෙටි කාලයකට නැවතත් ශ්‍රී ලංකාවට පැමිණියේය.

මහාචාර්ය බ්‍රෝන් මහතාගේ සේවය, යුනෙස්කෝ විශේෂඥ ආධාර යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල මණ්ඩලයට ලැබුණු අතර, මේ සම්බන්ධයෙන් ඒ මහතා මෙරටට පැමිණි සිව්වන වාරය මෙය වේ.

දැනට ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ වැඩ කටයුතු වලින් සියයට හැත්තෑ පහක පමණ වැඩ නිමවී ඇති අතර, එහි අවසාන අදියර පරික්ෂා කර බලා අවශ්‍ය උපදෙස් දීමත්, ජාතික පුස්තකාලයට අවශ්‍ය ගෘහ භාණ්ඩ සැලැසුම් කිරීමත් මෙවර මහාචාර්ය බ්‍රෝන් මහතාගේ පැමිණීමේ ප්‍රධාන පරමාර්ථය වේ.

එක්සත් රාජධානියේ බාත් (BATH) විශ්ව විද්‍යාලයේ ගෘහ නිර්මාණ ශිල්ප අංශයේ අධිපතිවරයා වන මහාචාර්ය බ්‍රෝන් මහතා, පුස්තකාල ගොඩනැගිලි පිළිබඳ විශේෂඥවරයෙකු ලෙස සැලකේ.

මෑතදී චීනයේ සහ ජෝර්දානයේ පුස්තකාල ගොඩනැගිලි සම්බන්ධව උපදෙස් දීමටද යුනෙස්කෝ ආයතනය ඒ මහතාගේ විශේෂඥ සහාය ලබා ගන්නා ලදී.

# මහජන පුස්තකාල පිළිබඳ යුනෙස්කෝ ප්‍රඥප්තිය

**1972** සංශෝධිත මහජන පුස්තකාල ප්‍රඥප්තිය, සම්පූර්ණයෙන් මෙහි පහත දක්වේ. එක් එක් පුස්තකාලයට හැකි පරිදි මේ ප්‍රකාශයේ නිර්දිෂ්ඨ ඉලක්ක කරා ළඟාවීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා මාර්ගෝපදේශකත්වය මෙයින් සැපයේ.

## යුනෙස්කෝව සහ මහජන පුස්තකාල

"මහජන පුස්තකාලය ජීවමාන අධ්‍යාපනික සංස්කෘතික හා සන්නිවේදන මාධ්‍යයක් වන අතර ජනතාව හා ජාතීන් අතර අන්‍යෝන්‍යාන්‍ය වැටහීම, සාමය සහ සුහදතාවය වර්ධනය කිරීමෙහිලා උපයෝගී වන පොදු ආයතනයකි. පුස්තකාල පිළිබඳ යුනෙස්කෝ සංවිධානයෙහි මෙම ආකල්පය හැඩගැසී ඇත්තේ , "මානව සංහතියේ සාමය හා අධ්‍යාත්මික අභිවෘද්ධිය වර්ධනය කිරීම පිණිස මිනිසාගේ මනස යථා පරිදි හැඩ ගැස්සිය යුතුය" යන මූලික ධර්මතාවය පදනම් කර ගෙනය.

## මහජන පුස්තකාලය, අධ්‍යාපනය, සංස්කෘතිය හා සන්නිවේදනය පිළිබඳ ප්‍රජාතන්ත්‍රීය ආයතනයකි

අඛණ්ඩ වූද, යාව ජීව වූද, සර්වජන වූද අධ්‍යාපනයක් සැපයීම ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික යුතුකමක් වශයෙන්ද, මානව සමාජය අධ්‍යාපනික හා සංස්කෘතික වශයෙන් ලබන ප්‍රගතිය තාත්විකව අගය කිරීමේ සංකේතයක් වශයෙන්ද මහජන පුස්තකාලය සැලකිය යුතුය.

මිනිසාගේ සිතුම් පැතුම් හා නිර්මාන්තනික කුශලතාවයන් පිළිබිඹු කරන්නා වූ ලේඛන සම්භාරය නොමිළයේ නිදහසේ හා පොදුවේ පරිහරණය හා භුක්ති විඳීම සලසන ප්‍රධාන මාර්ගය මහජන පුස්තකාලයයි.

විවේකය හා විනෝදය සඳහා පොත්පත් සම්පාදනය කර දීමෙන් මිනිසාගේ අධ්‍යාත්මික පුනර්ජීවනයක් ඇති කිරීමද, ඉගෙන ගැනීමෙහි නිරතවූවන් සඳහා අවශ්‍ය දැනුම සපයා දීමෙන්ද පොදුවේ තාක්ෂණික විද්‍යාත්මක හා සමාජ ක්ෂේත්‍රයන්හි නවතම දැනුම ළඟා කර දීමෙන්ද මහජන පුස්තකාලය සේවය කෙරේ.

සමස්ත ජාතික මහජන පුස්තකාල සේවා ඇති කිරීම නීතියේ අවශ්‍යතාවක් ලෙස ඉටුවෙන පරිදි මෙම ආයතන පිහිටුවීම වැදගත්ය. ජාතිය සතු සකල සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය සෑම පාඨකයෙකුටම ලැබෙන පරිදි මනාව සංවිධානය වූ අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩ පිළිවෙලක් සකස්විය යුතුයි.

එහි සේවය සඳහා කෙලින්ම පාඨකයාගෙන් කිසිම මුදලක් අය කළ යුතු නොවේ. මහජන පුස්තකාල සේවය රජයේ මුදල්වලින් පවත්වාගෙන යා යුත්තකි.

මෙම අභිමතාර්ථයන් නොවළහා ඉටුකර ගැනීම සඳහා මහජන පුස්තකාලය අනවරතයෙන්ම ජාති භේද, ආගම් භේද, භාෂා භේද, අධ්‍යාපනික හා වෘත්තීය භේද, ලිංග භේද, සමාජ හා ජීවන තත්ව භේද ඉක්මවූ ආයතනයක් ලෙස පවත්වාගෙන යා යුතුය.

## සම්පත් සහ සේවා

සමකාලීන සමාජය පිළිබඳ හොඳ අවබෝධයක් ලබා ගැනීම සඳහාද, නිරන්තරයෙන්ම තම තමාගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහාද, විද්‍යාත්මක කලාත්මක දියුණුවත් සමග පෙරට ඇදී යන සමාජයේ පෙරමුණ ගැනීමටද මහජන පුස්තකාලය ළමයින්ටත්, වැඩිහිටියන්ටත් උපකාරී වන ආයතනයක් විය යුතුය.

මහජන පුස්තකාලයේ සම්පත්, ඥානයේ හා සංස්කෘතික සංවර්ධනයේ කැඩපතක් විය යුතුයි. නවතම පොත පත ලබා දීමත්, ඒ පිළිබඳ තොරතුරු සිත් ගන්නා පරිදි ප්‍රචාරය කර හැරීමත් අවශ්‍යය. නිදහස් සහ නිවහල් අදහස් ජනනය කිරීම සඳහාත්, නිර්මානාත්මක වූද, විචාරාත්මක වූද. සංකල්පයන් වර්ධනය කිරීම සඳහාත්, සම්‍යක් අවබෝධය ඇති කරලීම සඳහාත් මහජන පුස්තකාලය මෙසේ සකස්වීම වැදගත් වේ. කුමන මාධ්‍යයකින් ප්‍රකාශ වුවද අදහස් හා දැනුම හුවමාරු කර ගැනීමට අත දීම, මහජන පුස්තකාලයේ මූලික බලාපොරොත්තුවය.

මුද්‍රිත පොත පත, ශත වර්ෂ ගණනාවක් තිස්සේ මානව අදහස් හා තොරතුරු බෙදා හැරීමේ මාධ්‍යය වශයෙන් භාවිතයට පැමිණ ඇති හෙයින් අදත් මහජන පුස්තකාල සම්පත් ප්‍රධාන වශයෙන් පොත්, සඟරා හා ප්‍රවෘත්ති පත්‍රවලින් සමන්විතය.

එහෙත් නූතන විද්‍යාත්මක සොයා ගැනීම් නිසා නව ලේඛන මාධ්‍යයන් බිහිවී තිබේ. ගබඩා කිරීමේ හා එහා මෙහා ගෙන යෑමේ පහසුකම් ඇති සූක්ෂම මුද්‍රණ, ඡායා, සේයා රාමු, ග්‍රැමපෝන් තැටි ශ්‍රව්‍ය හා දෘෂ්‍ය පටි මෙයින් සමහරකි, මෙම ද්‍රව්‍ය සහ ඒවා පාවිච්චියට අවශ්‍ය උපකරණද වෙන් වෙන් වශයෙන් හා පොදු වශයෙන් යොදාගැනීමට හැකි වන පරිදි මහජන පුස්තකාලවල රැස්කර තැබීම අවශ්‍යය.

සියලු පාඨකයින්ගේ රුචි අරුචිකම් වලට ගැලපෙන පරිදි ද. අවශ්‍ය තාවන් සපුරාලන පරිදි ද සියලුම අධ්‍යාපනික හා සමාජීක මට්ටම්වල පාඨකයින්ට ගැලපෙන සේ ගොඩ නගන ලද විවිධ විෂයයන්ගෙන් සමන්විත පොත් එකතුවක් පුස්තකාලයේ තිබිය යුතුයි.

පුස්තකාලය ආශ්‍රිත ප්‍රදේශයේ වෙසෙන විවිධ ජාතීන්ගේ භාෂාවලින් රචිත පොත පත මෙන්ම, පොදු සාහිත්‍ය ලෝකයේ උසස් යැයි පිළිගැනීමට පාත්‍රවූ මුල් භාෂාවලින් ලියැවුනු ග්‍රන්ථවල පිටපත් ද එහි තැන්පත් විය යුතුය.

පුස්තකාලය පිහිටවිය යුත්තේ ශාරීරික දුබලතාවන්ගෙන් පෙළෙන්නවුන්ට වුවද, පහසුවෙන් ළඟාවිය හැකි මධ්‍යස්ථානයකය. පුස්තකාල ගොඩනැගිල්ල ගෘහ නිර්මාන ශිල්පීය වශයෙන් සිත්කළු විය යුතුය. එහි පරිහරණය වන ගෘහ භාණ්ඩ චාම්ව සිත් අදනා ලෙස නිර්මාණය කළ යුතුය. පොත් රාක්ක විවෘතව තැබිය යුතුයි.

මහජන පුස්තකාලය කරා රොක්වන ජනයා ස්වභාවයෙන්ම සමාන අධ්‍යාෂයයන් ඇති පිරිසක් හෙයින් එය ස්වාභාවික සමාජ ශාලාවකි. එබැවින් ළමයින් හා වැඩිහිටියන් සඳහා ප්‍රදර්ශණ, සාකච්ඡා දේශන, සංගීත වැඩ සටහන්, චිත්‍රපට දර්ශණ යනාදිය සඳහා අවශ්‍ය ඉඩ කඩ සහ උපකරණ සම්පාදනය කළ යුතුය.

සුළු නගර හා ග්‍රාමීය පෙදෙස්වල ශාඛා පුස්තකාල හෝ ජංගම පුස්තකාල සේවයක් තිබිය යුතුය.

පොත් පත් තෝරා ගැනීම, සංවිධානය කිරීම් යනාදියෙන් පාඨකයිනට සහායවීම පිණිස අවශ්‍ය තරම්, පුහුණු කරන ලද දක්ෂ පුස්තකාල සේවක පිරිසක් සිටීම ඉතාම වැදගත්ය. විශේෂ සේවා අංශවන ළමා සේවා, අංග විකල සේවා, ශ්‍රව්‍ය-දෘෂ්‍ය සේවා හා කලාත්මක කාර්ය සංවිධානය සඳහා විශේෂයෙන් පුහුණු වූවන් අවශ්‍යය.

## ළමා සේවය

පොත්පත් පිළිබඳ ආශාවක් ඇතිවීමත්, පුස්තකාල සහ එහි සම්පත් පරිහරණය පිළිබඳ පුරුද්දක් ඇති කර ගැනීමටත් ඉතාමත් පහසු කාලය ළමා කාලයයි. එබැවින් ළමයින්ගේ රුචිය වඩවන පොත් පත් හා වෙනත් අවශ්‍ය අධ්‍යාපනික ද්‍රව්‍ය සැපයීම මහජන පුස්තකාලය සතු වැදගත් යුතුකමකි. ළමුන් සඳහා විශේෂ පොත් එකතුවක්, හැකිනම්, විශේෂ ළමා අංශයක් පිළියෙල කිරීම සුදුසුය. එමගින් ළමා පුස්තකාලය සංස්කෘතික කටයුතු පිළිබඳ උනන්දුවක් ඇති කරවන ක්‍රියාශීලී ආයතනයක් වන්නේය.

## ශිෂ්‍ය සේවය

සියළුම ශිෂ්‍යයිනට, තම පාසැල් හා වෙනත් අධ්‍යාපනික ආයතනයන් වලින් ලබා ගන්නා පහසුකම්වලට අමතර වශයෙන් මහජන පුස්තකාලයෙන් තම අධ්‍යාපනික කටයුතුවලට උපකාරිවන සේවයක් ලබා ගැනීමට හැකිවිය යුතුය. පෞද්ගලිකව අධ්‍යාපන කටයුතුවල නිරතව සිටින ශිෂ්‍යයිනට සම්පූර්ණයෙන්ම මහජන පුස්තකාලයේ පිහිට අවශ්‍යය.

## අංග විකල පාඨක සේවය

වයෝවෘද්ධයින් සහ නානා අංග විකල භාවයෙන් අභාග්‍ය සම්පන්න දිවි පෙවෙතකට ගොදුරු වූවන්ගේ ශුභ සාධනය විශේෂයෙන් සැළකිය යුත්තකි. ඔවුන්ගේ හුදකලාව හා මානසික හා ශාරීරික අසහනය තුනී කිරීම සඳහා වැදගත් සේවයක් මහජන පුස්තකාලයෙන් සිදු කළ හැක.

පුස්තකාලයට පැමිණීමේ පහසුකම් වැඩි දියුණු කිරීම, කියවීමේ යාන්ත්‍රික උපකරණ සැපයීම, මහළු මඩම් ආරෝග්‍යශාලා වැනි ආයතනයන් හී එවැනි ශ්‍රව්‍ය දෘෂ්‍ය හා පාඨක සේවා ආරම්භ කිරීම ජංගම පුස්තකාල මගින් ගෙදරට පොත පත ළඟා කර දීම, යනාදී ව්‍යාප්ත සේවා මගින් මෙම යුතුකම ඉටුකළ හැක.

## මහජන පුස්තකාලය හා සමාජය

මහජන පුස්තකාලයේ පරමාර්ථ හා සේවාවන් කැපී පෙනෙන ලෙස කාර්යශීලීව කටයුතු කිරීමෙන් එය සමාජයේ අවධාරණයට යොමු කළ යුතුය.

අධ්‍යාපන හා සංස්කෘතික සංවර්ධනයේ නියැලි පාසැල්, වැඩිහිටි අධ්‍යාපනික ආයතන, විනෝද කවයන් වැනි සංස්ථා සමග කිට්ටු සම්බන්ධතාවක් ඇති කර ගැනීමෙන් මහජන පුස්තකාල සේවය වඩා ජනප්‍රිය කරවීම පහසුවෙන් ඉටුකර ගත හැක.

සමාජයේ අළුතින් ඇතිවන අවශ්‍යතා හා අළුත් පාඨක කොට්ඨාශයන්ද ඔවුන්ගේ ඕනෑ එපාකම් ගැනද විමසිල්ලෙන් සිටියහොත් මහජන පුස්තකාල සේවය ඔවුනට ගැලපෙන පරිදි ගොඩනැගීමටත් එයින් එම සේවාවන් කාලෝචිතව ව්‍යාප්ත කිරීමටත් හැකිවන බව ඒත්තු ගත යුතුය.

● ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් 1977 දී ප්‍රකාශිත මහජන පුස්තකාල ප්‍රමිති (සිංහල සංස්කරණය) කෘතියෙන් උපුටා ගන්නා ලදී.

# ජාතික විද්‍යා සභාවේ හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ මෙහෙයවීමෙන්

# වැඩ මුළුවක්

**ජාතික විද්‍යා සභාවේ සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ මෙහෙයවීමෙන් පැවති වැඩ මුළුවක් පසුගිය ජූලි මස හයවන දින ජාතික විද්‍යාභිවර්ධන ආයතනයෙහි ඇරඹුනු අතර, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති එම්. ජේ. පෙරේරා මහතා විසින් එය විවෘත කරන්නට යෙදිණි.**

ශ්‍රී ලංකාවේ විශේෂ සහ විශ්ව විද්‍යාල පුස්තකාලවල සේවය කරන තෝරා ගත් පුස්තකාලයාධිපතිවරු විසි-දෙනෙකු පමණ පිරිසක් මෙම වැඩ මුළුවට සහභාගි වූහ.

මෙහිදී කතා කළ පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපතිවරයා විද්‍යාත්මක අංශයේ ප්‍රවෘත්ති ප්‍රචාරක කටයුතුවල නියැලී සිටින ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාවේ කාර්යයන් අගය කළ අතර, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවාවේ එය වැදගත් අංගයක් බව සඳහන් කළේය.

## නියෝජනය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ඉදිවෙමින් පවත්නා බවත්, එය අනාගතයේ ශ්‍රී ලංකාව පිළිබඳ සියළුම අංගයන් නියෝජනය කරන ජාතික පුස්තකාලය වන බවත්, එයට සහාය වශයෙන් ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව විද්‍යාත්මක අංශයේ තොරතුරු මධ්‍යස්ථානය වශයෙන් ක්‍රියා කිරීම වැදගත් අවශ්‍යතාවයක් සම්පූර්ණ කරන්නක් බවත් පැවසුවේය.

ජාතික පුස්තකාලයත්, ජාතික විද්‍යා සභාවත් තම තම අංශවල වැඩ කටයුතු මනා සංවිධානාත්මක ආකාරයකින් කරගෙන යාම අත්‍යවශ්‍ය බවත්, දෙපක්ෂයය තමන්ගේ වගකීම් හා කාර්යයන් පිළිබඳ මනා අවබෝධයකින් ක්‍රියා කිරීමත්, තවමත් අවධානය යොමු කර නොමැති අංශ පිළිබඳ අවධානය යොමු කිරීමටත්, අනවශ්‍ය ආකාරයට එකම ක්ෂේත්‍රයේ දෙපක්ෂයම කටයුතු කිරීමෙන් වැළකිය යුතු බවත් ඒ මහතා සඳහන් කළේය.

## උත්තරීතරයි

ශ්‍රී ලංකාව වැනි දියුණු වන රටක දැනුමේ වටිනාකම මිණිය නොහැකි බවත්, එම දැනුම රැස් කරගෙන ඒවා අවශ්‍ය අවස්ථාවලදී - අවශ්‍ය-අයට ලබාදීම වෙනත් සියලුම කාර්යවලට වඩා උත්තරීතර බවත්, ඒ සඳහා ජාතික වශයෙන් ක්‍රියා කරන ආයතන තම වගකීම් නියම ආකාරයෙන් ඉටු කිරීම අත්‍යවශ්‍ය බවත් සඳහන් කළේය.

## පුහුණුව

පුස්තකාල සහ ප්‍රවෘත්ති අංශවල සේවය කරන අය පුහුණු කරලීම ගැන සඳහන් කළ සභාපතිවරයා, පුස්තකාල හා ප්‍රවෘත්ති විද්‍යා ක්ෂේත්‍රවල නුපුහුණු පුස්තකාලයාධිපතීන් බැරෑරුම් ප්‍රශ්නයක් වී ඇති බවත්, මෙය විශේෂයෙන්ම මහජන හා පාසල් පුස්තකාල ක්ෂේත්‍රවලට තදින් බලපා ඇති බවත් පැවසීය. මේ නිසා ජාතික මට්ටමේ සියළුම පුස්තකාල ක්ෂේත්‍රවලට සම්බන්ධ ආයතන මෙම ප්‍රශ්නය විසඳීම සඳහා සැලැස්මක් ඇතිව ඉදිරිපත්වීම වැදගත් බවත් ඔහු ප්‍රකාශ කළේය.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ නියෝජිතවරයා කතා කරමින් ශීඝ්‍ර වූ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකාවට සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය ප්‍රවෘත්ති ක්ෂේත්‍රයේ නිලධාරීන් පුහුණු කිරීමට ආධාර කාරිවීමට ඉඩ ලැබීම ගැන සතුට ප්‍රකාශ කළේය.

මුලසුනේ කතාව කළ ජාතික විද්‍යා සභාවේ සභාපති ආර්. ජී. ජයවර්ධන මහතා මෙම සම්මන්ත්‍රණය හා පාඨමාලා පැවත්වීම ඉතාමත් වැඩදායක බවත්, ජාතික විද්‍යා ක්ෂේත්‍රයේදී ප්‍රවෘත්ති අංශය නොසලකා කිසිම වර්ධනයක් අපේක්ෂා කළ නොහැකි බවත් ප්‍රකාශ කළේය.

සම්මන්ත්‍රණය සංවිධානය කළ ජාතික විද්‍යා සභාවේ පුස්තකාලයාධිපති එන්. යූ. යාපා මහතා ස්තුති යෝජනාව කළේය.

# ශ්‍රී ලංකා - ඕස්ට්‍රේලියානු පුස්තකාල සහයෝගතා

නොබෝද දිවයිනේ සංචාරයක් සඳහා පැමිණි ඕස්ට්‍රේලියානු ජාතික පුස්තකාලයේ ඒඩ්රියන් වැන් ඇෂ් මහතා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සමග පැවති සාකච්ඡාවලදී ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය හා එරට ජාතික පුස්තකාලය අතරත්, පොදුවේ දෙරට අතරත් පුස්තකාල සහයෝගිතා වැඩ පිළිවෙල පිළිබඳව මූලිකව කරුණු සාකච්ඡා කරන ලදී.

මෙහිලා ශ්‍රී ලංකාවේ සහ ඕස්ට්‍රේලියාවේ ප්‍රකාශන දෙරටේ ජාතික පුස්තකාල අතර හුවමාරුව මෙම සහයෝගතා වැඩ පිළිවෙලෙහි මූලිකාංගයකි. මෙම වැඩ පිළිවෙල යටතේ ශ්‍රී ලංකා ප්‍රකාශන ඕස්ට්‍රේලියානු පොතපත සහ වාර ප්‍රකාශන සමග හුවමාරු කර ගැනීමට පුස්තකාල සේවා මණ්ඩලය එකඟතාවයකට පැමිණ ඇත.

මෙම හුවමාරු වැඩ පිළිවෙල යටතේ ඕස්ට්‍රේලියානු ජාතික පුස්තකාලය විසින් රුපියල් අසූ දහසකට වැඩි වටිනාකමකින් යුතු එරට ප්‍රකාශන තොගයක් දැනටමත් ප්‍රදානය කර ඇත.

මෙම පොත් ප්‍රදනය කිරීම පසුගියද උත්සවාකාරයෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේදී ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් මෙනස් විල්සන් මහතා විසින් පුස්තකාල මණ්ඩල සභාපති එම්. ජේ. පෙරේරා මහතා වෙත කරන ලදී.

# ත්‍රිකුණාමල මහජන පුස්තකාලය නව නිවහනක

ත්‍රිකුණාමල මහජන පුස්තකාලය නව ගොඩනැගිල්ලකට ගෙන යන බව වාර්තා වෙයි.

1835 නොවැම්බර් මස ත්‍රිකුණාමල ලන්දේසි කොටුවේ කුඩා ගොඩනැගිල්ලක බ්‍රිතාන්‍ය පරිපාලනය විසින් මෙම පුස්තකාලය විවෘත කරන ලද අතර, එය ශ්‍රී ලංකාවේ පැරණිතම පුස්තකාලයක් ලෙස සැලකේ.

එවක පිටකොටුවේ පුස්තකාලය නමින් හැඳින්වුන මෙකී පුස්තකාලයෙන් මුල් යුගයේ සේවය ලැබූවන් අතර ප්‍රමුඛයන් වූයේ බ්‍රිතාන්‍ය හමුදවල සාමාජිකයන් හා ත්‍රිකුණාමලයේ විසූ යුරොපීය ජනතාවයි.

වසර 146 කට ආසන්න කාලයක් පුස්තකාලය නිවහන කර සිටි පැරණි ගොඩනැගිල්ලෙන් නව ගොඩනැගිල්ල කරා පුස්තකාලය ගෙන යාම පසුගිය ජූලි මස දොළොස්වන දින සිදු කිරීමට නියමිතව තිබිණි.

ඔබ
මහජන පුස්තකාලයේ
සහතික කරන ලද වාර්තා
පහත ලිපිනයට
යොමු කරන්න:

අධ්‍යක්ෂ,
පුස්තකාල සේවා මණ්ඩලය
නිදහස් මාවත,
කොළඹ 7.
ටැලි: 98847



● **දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන්ගේ සම්මන්ත්‍රණයේ හා පාඨ මාලාවේ සමරු පොතින්.......**

පසුගිය මාර්තු මස ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පැවති දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන්ගේ සම්මන්ත්‍රණය හා පාඨ මාලාව අවසානයේ ඊට සහභාගි වූ පිරිස පාඨ මාලාව සංවිධානය කළ පුස්තකාල සේවා මණ්ඩලයේ නිලධාරීන් හා කාර්ය මණ්ඩලය ඇතුළු පාඨ මාලා දේශකයින්ද සමග ඡායාරූපයකට පෙනී සිටීමටද අමතක නොකළහ. ඡායාරූපයේ දකුණු පස සිට පස්වැන්නා මෙම පාඨ මාලාව සංවිධානය භාරව කටයුතු කළ පුස්තකාල සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ උපාලි අමරසිරි මහතාය. ඒ සමග පිළිවෙලින් අසුන්ගෙන සිටින්නේ සහකාර අධ්‍යක්ෂ එස්. එම්. කමල්දීන්, පුස්තකාල මණ්ඩල සභාපති එම්. ජේ. පෙරේරා, ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ එන්. අමරසිංහ, පළාත් පාලන සේවා අධ්‍යක්ෂ බී. ලියනමාන සහ රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ කේ. ඩී. ජී. විමලරත්න යන මහත්වරුය.

## පාසල් පුස්තකාලයාධිපතීන්ට උපදෙස්

# පාසල් පුස්තකාලයට හිමි ස්ථානය

**පාසල් පුස්තකාලයාධිපතීන්ට උපදෙස් නමැති මෙම විශේෂ ලිපි පෙළෙහි හතර වැන්න මෙහි පළවෙයි. මෙහි මූල් කොටස් පුස්තකාල ප්‍රවෘත්ති පුවත් පතේ 1 වන කලාපයේ අංකඃ 1 - 3 පත්‍රවල පළවිය.**

පුස්තකාලයට අයත් පොත් පත් හා වෙනත් පාඨක ද්‍රව්‍ය මනාව සංවිධානය කොට තැන්පත් කිරීමටත්, එම පොත්පත් අපහසුවක් නොමැතිව පරිහරණය කිරීමටත් අවශ්‍ය ඉඩකඩ පුස්තකාලයේ තිබිය යුතුය.

පොත් රාක්ක වලින් පහසුවෙන් පොත්පත් තෝරා ඉවතට ගැනීමට හැකිවන සේ පොත් රාක්ක අතර සෑහෙන පරතරයක් තබා රාක්ක අසුරා ගත යුතුය.

ශිෂ්‍යනට පුස්තකාලය තුල වාඩිවී සිය කටයුතු කර ගැනීමට තරම් සෑහෙන ඉඩකඩද සැපයිය යුතුය. ඇතැම් විට පන්තියක් පැවැත්වීමට අවශ්‍ය වන හෙයින් එවැනි සෑහෙන පිරිසකට අවශ්‍ය මේස පුටුද තිබිය යුතුය.

මීට අමතර වශයෙන් පුස්තකාලයාධිපතිගේ කාර්යයන් වන පොත්පත් සකස් කිරීම, ලිපි ලේඛන කටයුතු, පරිග්‍රහණය කිරීම, සූචිගත කිරීම, වර්ග කිරීම, ලේබල් ඇලවීම යනාදී කටයුතු සඳහාද සෑහෙන ඉඩ ප්‍රමාණයක් අවශ්‍යය. පුස්තකාලයාධිපතිගේ මේසය තබා ගැනීමටත්, පොත් බැහැර දීම හා ආපසු ලබා ගැනීම, පොත් නිකුත් කිරීමේ ලේඛන තබා ගැනීම යනාදියටද ඉඩකඩ අවශ්‍යය.

### පුස්තකාලයාධිපති

පුස්තකාලයාධිපතිවරයාද එක්තරා විධියේ ගුරුවරයෙකි. පාසැල් පුස්තකාල සේවයට බඳවා ගනු ලබන පුස්තකාලයාධිපතිවරුනට පුස්තකාලයේ අධ්‍යාපනික සේවය පිළිබඳ හොඳ වැටහීමක් තිබීම අවශ්‍යය. එසේම එම කටයුතු වලට සහයෝගය දක්වන්නකු වීමද අවශ්‍යය. පුස්තකාලයේ අරමුණ ඉටු වන පරිදි එය සංවිධානය කර ගැනීමට පොහොසත් විය යුතුය. අරමුණට යෝග්‍ය පරිදි සංවිධානය නොවූ පුස්තකාලයකින් සාර්ථක සේවයක් බලාපොරොත්තු විය නොහේ. පුස්තකාලය තම තමන්ගේ අධ්‍යාපනික කටයුතු සඳහා ප්‍රයෝජනයට ගත හැක්කේ කෙසේද යන්න ගුරු මණ්ඩලයට හා ශිෂ්‍යයනට වටහා දීමට සමත් විය යුතුය. පාසැලේ විෂය මාලාවලට අදල තොරතුරු අඩංගු පොත්පත් හා වෙනත් පාඨක ද්‍රව්‍ය ගැන තොරතුරු සොයා ගැනීමටත්, ඉන්පසු ඒවා පුස්තකාලයට ලබා ගන්නා පිළිවෙලත් ඔහු විසින් දැන සිටිය යුතුය.

එසේම තමාගේ කාර්යයන්ට අදල ලිපිකරු වැඩ හා පරිපාලන කාර්ය කරන පිළිවෙල ගැන හොඳ අවබෝධයක්ද ලබා සිටිය යුතු අතර, ඒවා පෙළඹවීමක් නොමැතිව සිය කැමත්තෙන්ම කිරීමට ඉදිරිපත්වීම අවශ්‍ය ලක්ෂණයකි.

පුස්තකාලයේ ශ්‍රව්‍ය-දෘෂ්‍ය පාඨක ද්‍රව්‍ය තිබේ නම්, ඒවාට අදල උපකරණ පාවිච්චිය ගැන දැනීමක් හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය ගැන වැටහීමක් තිබිය යුතුය.

### පූර්ණ කාලීන සේවයක්

ඉතාම සුළු වැඩකට වුවත්, වේලාවත් දැනුමත් අවශ්‍ය වේ. මේ නිසා ඉගැන්වීමෙහි නිරත ගුරුවරයකුට ඉතා කුඩා පුස්තකාලයක් වුවත් මනාව පවත්වා ගෙන යාම අපහසුය. ඉගැන්වීමේ කටයුතු වලින් ඔහු මුදවා පුස්තකාල කටයුතුවල නිරත කරවීම වඩා සුදුසුය. එම කාර්යවල ඔහු පුහුණු කරවීමද අවශ්‍යය.

ගුරු පුස්තකාලයාධිපතිවරයකුට සහාය වීම සඳහා ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෙක්, තෝරා ගත හැක. ඇතැම් විට දෙමාපියන්ගේ ස්වේච්ඡා සහාය වුවද ලබා ගැනීමට පුළුවන. එවැනි සහායක් ලබා ගැනීමේදී එම සහායකට පුස්තකාලයේ ක්‍රියා පරිපාටිය පහදදිය යුතුය. ශිෂ්‍යයන් හා දෙමව්පියන් පාසල් පුස්තකාල කටයුතුවලට සහභාගි කරවා ගැනීමෙන් පාසලේ හා පුස්තකාලයේ අධ්‍යාපනික කටයුතු කෙරෙහි ඔවුන්ගේ ඇති උනන්දුවද වර්ධනය කර ගත හැක.

ඉතා කුඩා පුස්තකාලයක් සංවිධානය කර ගැනීමට පුස්තකාල විද්‍යාවේ ගැඹුරු දැනුමක් අවශ්‍ය නැත. නමුත් ආරම්භයේදීම ක්‍රමානුකූල සංවිධානයක් ඇති කර ගැනීම සඳහා පුස්තකාල විද්‍යා දැනුමක් අවශ්‍ය වේ. ආරම්භය ක්‍රමානුකූල නුවුවහොත්, පුස්තකාලය ක්‍රමයෙන් වැඩෙන කල්හි එහි කටයුතුවල අවුල් සහගත තත්වයක් ඇතිවේ.

කුඩා පුස්තකාලයකට පූර්ණ කාලින පුස්තකාලයාධිපතිවරයෙක් අවශ්‍ය නොවේ යැයි තර්ක කළ හැක. එහෙත් පුස්තකාලය වැඩෙන ළමයෙකුට සමානය. කුඩා පුස්තකාලය මනාව වැඩෙන පුස්තකාලයක් බවට ගොඩ නැගීම සඳහා නිරන්තරයෙන් එහි අවශ්‍යතා ගැන සැලකිලිමත් විය යුතුය. නිරතුරුව එය පෝෂණය කළ යුතුය. එවැනි සැලකිල්ලක් කිරීම සඳහා පුස්තකාලයාධිපතිවරයෙකු පූර්ණ කාලිනව පත් කිරීම එහි ප්‍රගතිය වහ වහා ඉටුකර ගැනීමට උපකාරී වේ.

ඔබ පූර්ණ කාලින පුස්තකාලයාධිපති වරයෙකු නම්, ඔබගේ සේවය සම්පූර්ණයෙන් පාසලේ අභිවෘද්ධියට කැප වූවක් බව මෙනෙහි කරන්න. ගුරු මණ්ඩලය සමග කිට්ටු ආශ්‍රයක් ඇති කර ගන්න. පාසලේ අවශ්‍යතාවයන් ගැනද, පාසලේ අධ්‍යාපනික සැලසුම් ගැනද හොඳ අවබෝධයක් ලබා ගන්න. ඔබේ පුස්තකාලය ගුරුවරුන්ටත්, ශිෂ්‍යයන්ටත් නැතිවම බැරි දෙයක් ලෙස දියුණු කර ගත හැක්කේ එවිටය.

### සම්පත්

පාසලේ පුස්තකාලයක් පිහිටුවීම සඳහා ගොඩනැගිල්ලක්, කාර්ය මණ්ඩලයක් හා මුදල් අවශ්‍ය වේ. ආරම්භයේදීම මෙය වටහා ගැනීම අවශ්‍යය. මෙම අවශ්‍යතා ලබා ගැනීම සහතික වශයෙන්ම ඉටුවේදැයි තීරණය කළ යුතුය. මෙම අවශ්‍යතා ටික කලකින් අවසාන නොවන හෙයින් දීර්ඝ කාලීන පදනමක් මත තීරණයක් ගත යුතුය. සැලසුමක් නොමැතිව ඉතා උනන්දුවෙන් ආරම්භ කරන පුස්තකාලය අවුරුද්දකට පසු ඇණ හිටීමට පුළුවන.

එසේ වුවහොත්, ඒ සඳහා වැය කළ කාලය, ශ්‍රමය හා ධනය අපතේ ගියා වේ. අතේ ඇති මුදල් ප්‍රමාණය කුඩා වුවත්, අඛණ්ඩව මුදල් යෙදවීමේ පදනමක් මත ආරම්භ කරන සේවය ක්‍රමයෙන් දියුණු වේ.

පුස්තකාලය අවශ්‍ය සේවාවක්ය යන ස්ථිර නිගමනයන්, ආරම්භ කිරීමෙන් පසු දිගටම එය පවත්වාගෙන යනු ඇත. යන තීරණයක් අවශ්‍යයෙන්ම ගත යුතුය. එම තීරණය ගත යුත්තේද පාසල් ප්‍රධානීන් ඇතුළු ගුරු මණ්ඩලය විසිනි.

**විශේෂ ලියුම්කරුවකු විසිනි**

# රත්නපුර පුස්තකාල අධ්‍යයන වැඩ මුළුව

ඒ. එම්. ගුණපාල විසිනි

රත්නපුර මහජන පුස්තකාලය මගින් පුස්තකාල විස්තාරිත සේවා යටතේ පුස්තකාල අධ්‍යයන වැඩ මුළුවක් 1981 මැයි 25, 26, 27 යන දිනයන්හි නගරාධිපති ඇම්. ඒ. ගුණතිලක මහතා හා වැඩ බලන නාගරික කොමසාරිස් සෝමා ගුණසේන මහත්මියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. මෙම අධ්‍යයන වැඩ මුළුව සඳහා අලුත් පොත් ප්‍රදර්ශණයක්, පාඨශාලාන්තර කථික තරඟයක් හා පාඨක සම්මන්ත්‍රණයක් ඇතුලත්විය.

1981 පළමුවන කාර්තුව සඳහා මිළදී ගන්නා ලද අලුත් පොත් ප්‍රදර්ශණය සඳහා ඇතුළත් කරන ලදී. ළමා හා වැඩිහිටි අංශ සඳහා මිළදී ගන්නා ලද සිංහළ, දෙමළ හා ඉංග්‍රිසි පොත් ද, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් පරිත්‍යාග කරන ලද පොත් ද ප්‍රදර්ශණය සඳහා ඉදිරිපත් කෙරිණ.

මෙම අධ්‍යයන වැඩ මුළුව දෙවන අංකය වශයෙන් පවත්වන ලද්දේ මහ නගර සභා සීමාව තුළ පිහිටි පාඨශාලාන්තර කථික තරඟයයි. මේ සඳහා මහා විද්‍යාල දහයක පමණ තරඟකරුවන් සහභාගි වූහ. තරඟය සඳහා ඉදිරිපත් කරණ ලද්දේ පහත සඳහන් මාතෘකා දෙකය.

1. රටක් සංවර්ධනය කිරීමෙහි ලා මහජන පුස්තකාලය සතු කාර්ය භාරය.
2. පුස්තකාලය අපගේ දැනුම වඩාලයි.

මෙම කථික තරඟයෙන් ප්‍රථම ස්ථානය හිමිකර ගන්නා ලද්දේ ර/සීවලී මහා විද්‍යාලයේ එන්. ඩී. ලක්ෂ්මි වසන්ති ශිෂ්‍යාව විසිනි. දෙවන ස්ථානය ර/ශාන්ත ඇලෝසියස් මහා විද්‍යාලයේ පී. එම්. ටී. නිමල් ශිෂ්‍යයා විසින් ද, තෙවන ස්ථානය ර/ජේසු බිළිඳුන්ගේ කන්‍යාරාම බාලිකා මහා විද්‍යාලයේ චම්පා මාලනී උපසේන ශිෂ්‍යාව විසින්ද හිමි කර ගන්නා ලදී.

පුස්තකාල පාඨක සම්මන්ත්‍රණය මෙහෙයවන ලද්දේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක එම්. එස්. යූ. අමරසිරි මහතාගේ ප්‍රධානත්වයෙනි. ඒ මහතා ''මහජන පුස්තකාලය ප්‍රයෝජනයට ගන්නා අන්දම හා රටක් සංවර්ධනයෙහිලා එහි ඇති වැදගත්කම'' යන මැයෙන් දේශණයක් පවත්වන ලද අතර ''ලංකාවේ පුස්තකාල ඉතිහාසය'' පිළිබඳ දේශණයක් පූජ්‍ය ගඟුල් විටියේ සුදස්දී හිමියන් විසින් පවත්වන ලදී.

පාඨක සම්මන්ත්‍රණය අවසානයේ කථික තරඟයේ ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග හා සහතික පත් පිරිනමන ලදී. ත්‍යාග හා සහතික පත් පිරිනැමීම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක එස්. එම්. කමල්දීන් මැතිතුමා අතින් සිදු කරණ ලදී. ප්‍රථම ස්ථානය හිමිකර ගත් පාසැලට හිමි ඇම්. ඒ. ගුණතිලක (නගරාධිපති) අභියෝග පළිහ පිරිනැමීම නාගරික මන්ත්‍රී මාන්නප්පෙරුම මැතිතුමා අතින් සිදු කෙරිණ.


සෑම පුස්තකාලයකටම
පොත පත පිළිබඳ
අළුත්ම සහ සාධිකාරි
තොරතුරු සඳහා

**ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය**

අළුත් දායක මුදල රුඃ 80/-
තැ: ගා: සමගය.

චෙක්පත්, මුදල් ඇනවුම් —
අධ්‍යක්ෂ,
පුස්තකාල සේවා මණ්ඩලය
නිදහස් මාවත,
කොළඹ 7.
ටැලි: 98847

# ජාතික පුස්තකාලයට පොත් රැස් කරයි !

**ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ගොඩ නැගෙමින් පවතින මේ අවස්ථාවේ ඒ සඳහා පොත් හා අනෙකුත් ප්‍රකාශන රැස් කිරීමද ආරම්භ කර ඇත.**

1885 දී ප්‍රකාශයට පත් කරන ලද මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයන්ගේ ආඥා පණතෙහි 1976 වර්ෂයේ ඇති කරන ලද සංශෝධනයන් අනුව, එම වර්ෂයේ නොවැම්බර් මස සිට ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කෙරෙන සෑම ප්‍රකාශයකින්ම පිටපතක් පුස්තකාල සේවා මණ්ඩලයට ලැබෙන අතර, මේවා විමර්ශණය සඳහා තැන්පත් කිරීම සිදුවේ.

ශ්‍රී ලංකාව පිළිබඳ ප්‍රකාශන මෙන්ම, බෞද්ධාගම, බෞද්ධ සංස්කෘතිය පිළිබඳ පොත්, අත් ලිපි සහ පුස්කොළ පොත් මෙන්ම, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයෙන් ඇති පුස්තකාල ද්‍රව්‍යයද රැස් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරන අතරම, විශේෂ විෂය විමර්ශණ කෘතීන්ද මේ සඳහා එක් රැස් කිරීම කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ.

ජාතික පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස සැලකෙන ජාතික පුස්තකාලයෙහි පැරණි අත් ලිපි සහ දැනට මුද්‍රණයේ නොමැති පොත් පත් සංරක්ෂණය කර විමර්ශණ කටයුතු සඳහා එක්රැස් කිරීමද දැනට කරගෙන යනු ලබයි.

මෙම එකතුව සඳහා පරිත්‍යාග වශයෙන් සහ මිළදී ගැනීමෙන් පොත් පත් රැස්කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, දැනට ප්‍රකාශන 50,000 ක් පමණ රැස්කර ඇත.

දුර්ලභ ගණයේ පොත්පත් මෙන්ම, පුස්තකාල පොත්ද මෙයට ඇතුළත් වේ. සෑම විෂයයන්ගෙන්ම සමන්විත කෘතීන් මෙම එකතුවෙහි අඩංගුව ඇත. ඉතා මෑතදී ආරම්භ කළ මෙම එකතුව සඳහා පරිත්‍යාග වශයෙන්ද පොත්පත් ලැබී ඇත.

පසුගිය වර්ෂයේ දෙසැම්බර් මස අභාවප්‍රාප්ත වූ දෙස්තර ඊ. එම්. විජේරාම මහතා විසින් පරිත්‍යාග කරන ලද පෞද්ගලික පුස්තකාලය පොත් මේ සඳහා ලැබී ඇති වටිනා පොත් එකතුවකි. මෙහි ශ්‍රී ලංකාව පිළිබඳ ඉතා දුර්ලභ කෘතීන් මෙන්ම, එතුමා විසින් පරිහරණය කරන ලද වෛද්‍ය ග්‍රන්ථ එකතුවක්ද ඇතුළත් වේ.

මාතලේ විසූ අභාවප්‍රාප්ත කේ. බී. පෙතියාගොඩ නිළමේතුමාගේ පොත් එකතුවක් සහ වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ අත් ලිපි කිහිපයක්ද එතුමාගේ ඥාතියෙකු විසින් පරිත්‍යාග කර ඇත.

මේ හැරෙන්නට වටිනා පෞද්ගලික පොත් එකතු කිහිපයක්ද මිළදී ගැනීමට මණ්ඩලයට හැකිවූ අතර, ඉතා වටිනා ශාස්ත්‍රීය කෘතීන් මෙන්ම, දුර්ලභ ග්‍රන්ථද මේවාට ඇතුළත්ව ඇත.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සිංහල අංශයේ හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්. එච්. පීටර් සිල්වා මහතාගේ පෞද්ගලික පුස්තකාලයද මෙහි විශේෂයෙන් වැදගත්වන තවත් පොත් එකතුවකි.

ශ්‍රී ලංකාවේ අග්‍ර ගණ්‍ය පඬිවරයෙකු වන මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතාගේ පෞද්ගලික පුස්තකාලය ජාතික පුස්තකාලයේ තැන්පත් කිරීම සඳහා මිලයට ගැනීමට අවස්ථාව ලැබීම ජාතික පුස්තකාලය ගොඩ නැගීමේ ක්‍රියාවලියේ විශේෂ වැදගත් කමක් උසුලයි. සිංහල සාහිත්‍යය, භාෂාව, වාග් විද්‍යාව සහ ඊට අදාල ක්ෂේත්‍ර රැසක ප්‍රවීන උගතකු වන මහාචාර්ය හෙට්ටි ආරච්චි මහතාගේ පුස්තකාලයේ වෙළුම් හාර දහසකට වඩා ඇත. මේ අතර වෙන කිසිදු පුස්තකාලයක ලබා ගත නොහැකි අගය මිණිය නොහැකි ග්‍රන්ථ රාශියක් ද ඇත.

විශේෂයෙන්ම උගතුන්ගේ පෞද්ගලික පුස්තකාලවල අඩංගු වටිනා ශාස්ත්‍රීය කෘතීන් මෙන්ම, පැරණි පුස්කොළ ආදිය සංරක්ෂණය කර, විමර්ශණය සඳහා ජාතික පුස්තකාලයේ තැන්පත් කිරීමට උනන්දු විය යුතු අවස්ථාව එළඹ ඇතැයි මේ පිළිබඳව ප්‍රකාශයක් කළ ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ එන්. අමරසිංහ මහතා ප්‍රකාශ කළේය.

## මුද්‍රණ ශිල්පයේ නිර්මාතෘට උපහාර ප්‍රදර්ශණයක්

මුද්‍රණ කලාවෙන් ලොවෙහි වන විපර්යාසය යන තේමාවෙන් යුතු ප්‍රදර්ශණයක් මුද්‍රණ ශිල්පයේ නූතන නිර්මාතෘවරයා වශයෙන් සැලකෙන ජොහැන්නස් ගටන්බර්ග් ශිල්පියාට උපහාර වශයෙන් කොළඹ නව මහජන පුස්තකාල ගොඩනැගිල්ලේදී 1981 ජනවාරි මස 26 වැනි දින සිට පෙබරවාරි මස 4 වැනි දින දක්වා පැවැත්විණි.

මෙම ප්‍රදර්ශණය පැවැත්වූයේ ජර්මන් සංස්කෘතික ආයතනයේද සහයෝගය ඇතිවය.

මෙම ප්‍රදර්ශණය ඡායාරූප සහ මුද්‍රණ ශිල්පයේ ඉතිහාසය හුවා දක්වන මුද්‍රණ ආකෘතිවලින්ද සමන්විත විය.

පහලොස්වන සියවසේ මැද මැද භාගයේ දී පමණ ගටන්බර්ග් විසින් පොත පත මුද්‍රණයට උපයෝගීවන ප්‍රථම මුද්‍රණ යන්ත්‍රය නිර්මාණය කරන්නට යෙදිණි. අති රමණීය නිමාවකින් යුතු ගටන්බර්ග් බයිබලය ලොව මුද්‍රිත ප්‍රථම පුස්තකය ලෙස සැලකේ. කෙසේ වුව මෙම ව්‍යාපෘතියේ සාර්ථක භාවය ගැන සැක පහළ කළ මුදල් ආයෝජකයෝ ගටන්බර්ග් වෙතින් තම මුදල් ආපසු ඉල්ලා සිටියහ. 1468 දී ඔහු මිය ගියේ කිසිවකු නොදත් දුප්පතෙකු වශයෙනි.

එසේද වුවත් ගටන්බර්ග් නිර්මාණය කළ මුද්‍රණ කලාව ලොව පුරා ලැව් ගින්නක් මෙන් පැතිර ගියේය. එක්දහස් පන්සියය වන විට පොත් දස ලක්ෂයක් මුද්‍රණයෙන් ප්‍රකාශිතව තිබූ බව වාර්තාවල දැක්වේ.

ගටන්බර්ගේ බයිබලයේ පාච්මන්ට් කඩදසියේ මුද්‍රිත පිටපත් කිහිපයක් තවමත් සංරක්ෂණය කර පවතින අතර, මෙහි අකුරු ඇමිණීම සඳහා අකුරු අමුනන්නන් හයදෙනෙකු පමණ යොද ගන්නා ලදැයි දැක්වෙන අතර, එම කාර්යය නිම කිරීම සඳහා අඩුම තරමින් අවුරුදු දෙකක්වත් ගතවන්නට ඇතැයි සැලකේ. අද මේ මොහොත වන විට පිටපත් දස ලක්ෂ ගණනින් මුද්‍රණය කළ හැකි නව මුද්‍රණ යන්ත්‍ර බිහිවී ඇත්තේ මේ පුරෝගාමියා හෙළි කළ මග නිසාවෙනි.

දුර්ලභ ග්‍රන්ථ 1 වැනි පිටුවෙන්..............

එම ග්‍රන්ථ එකී විෂයයන් පිළිබඳ උනන්දුවක් දක්වන විද්වතුන් උපරිම ගණනාවකට ලබා ගැනීමට හැකි වන අයුරු එක් අයකුට එක් පිටපතක් පමණක් බැගින් අලෙවි කිරීමට කටයුතු යොද ඇති බවද දැක්වේ.

දැනට ප්‍රකාශයට පමුණුවා ඇති පොත් අතර, එච්. ඩබ්ලිව්. කොඩ්රින්ටන්ගේ කාසි සහ නෝට්ටු, පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ එපිග්‍රැපියා සෙලෙනිකා පළමුවන වෙළුම, ආචාර්ය ආර්. එල්. බ්‍රෝහියර්ගේ ඕලන්ද යුගයේ ලංකාවේ ගෘහ භාණ්ඩ, ආචාර්ය ආනන්ද කුමාරස්වාමිගේ මධ්‍ය කාලීන සිංහල කලා, ඔහුගේම තවත් කෘතියක් වූ කොළඹ කෞතුකාගාරයේ ලෝහ ප්‍රතිමා, ආචාර්ය එස්. පරණවිතානගේ ලංකාවේ ස්ථූප යන ආදී අගනා ග්‍රන්ථ ගණනාවක් ඇත.

මේ හැර ජ්. ඩබ්ලිව්. පෙරේරාගේ කොඩි සහ ධජ යන කෘතිය දැනට රජයේ මුද්‍රණාලයේද, කොළඹ කෞතුකාගාරයේ තැන්පත්ව තිබෙන පුස්තකාල පොත් නාමවලිය නැමති කෘතිය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙනුවෙන් රජයේ මුද්‍රණ සංස්ථාවේද මුද්‍රණය වෙමින් පවතින බව වාර්තා වෙයි.

### මහජන පුස්තකාලය

1 වැනි පිටුවෙන්......

මෙම අවස්ථාව නිමිති කර ගෙන සමරු කලාපයක් සහ නුවණට මං නමින් ලිපි සංග්‍රහයක් පළ කරන්නටද යෙදී ඇත. ප්‍රධාන පුස්තකාලයාධිපතිනි ඊශ්වරී කොරයා මහත්මියගේ සංස්කාරකත්වයෙන් සකස් කරන ලද මෙම සංග්‍රහයේ පුස්තකාල සහ ප්‍රවෘත්ති විද්‍යා විෂයය ඇතුළු ලංකාවේ පුස්තකාල සහ ප්‍රවෘත්ති විද්‍යා කටයුතු පිළිබඳ සාරවත් ලිපි රැසක් අඩංගු වී ඇත:

**ඔබ**

මහජන පුස්තකාලයේ
සහතික කරන ලද
වාර්තා
පහත ලිපිනයට
යොමු කරන්න.

අධ්‍යක්ෂ,
**පුස්තකාල සේවා**
**මණ්ඩලය**
නිදහස් මාවත,
කොළඹ – 7 වැලි: 98847

# පුස්තකාල ප්‍රවෘත්ති



# NON-ALIGNED NATIONS DATA BANK

**The National Library of Sri Lanka will house the non-aligned nations Data Bank which will be established shortly in Colombo.**

The proposal to set up an International Data Bank of the Non-aligned nations was first mooted by the Sri Lankan delegation to the Ministerial Meeting of the Non-aligned countries in Havana in 1978. The proposal was welcomed by all participating countries and cooperation in the project was promised. The project was finally approved at the Non-aligned Conference held in India last month.

The proposed data bank will enable the non-aligned nations to meet the politcal, social, economic, scientific and other information needs of the developing countries and is considered a move towards self-reliance in information and the evident need to reduce the almost complete dependance of developing countries on information sources located in the North. The growing volume of information dealing with specific problems of development in the third world countries will be a welcome supplement to the information available from industrialised countries.

The information collected will be stored in a computer with on-line communication facilities. The possibilities of using satellite communication is under consideration.

The project is undertaken by the Ministry of Foreign Affairs, Sri Lanka on behalf of the Non-Aligned Nations.

## TRAINING COURES FOR DISTRICT CENTRAL LIBRARIANS

**A training course for librarians who will be in charge of District Central Libraries will be held from the 9th to the 19th of March 1981, at the Sri Lanka Foundation Institute.**

The course has been organised by the National Library Services Board with the assistance of the Asia Foundation in its programme of developing Central Libraries which will serve as the base for various facilities such as mobile library services, in-service training, audio-visual equipment, library co-operation etc. About 40 major libraries from 24 districts have been chosen to serve as District Central Libraries and their Chief Librarians will follow this course.

The Minister of Educational Services, Hon, Lionel Jayatilake will inaugurate the course, Assistant Commissioners of Local Government and the Chairmen of the local bodies in the project have also been invited to participate in the seminar which will follow the inauguration ceremony.

The lectures and the discussions at the course will be conducted by lecturers experienced on various aspects of Library and Information Science.

## රාජ්‍ය සාහිත්‍ය සම්මාන ලත් ග්‍රන්ථ

*1979* වසරේ ලියැවුණු හොඳම සාහිත්‍ය කෘතීන් වශයෙන් මෙවර සාහිත්‍ය උළෙලේදී ත්‍යාග හිමි කර ගන්නා ලද කෘතීන් මෙසේය.

### නවකථා (ත්‍යාග දෙකයි)

'හේ සිද්ධාර්ථ නම් වෙයි'; කර්තෘ: කේ. ආනන්ද හිමි - ත්‍යාගය රුපියල් 5000/- යි.

'සෙබළ කුමරිය'; කර්තෘ: මහානාම දිසානායක - ත්‍යාගය රුපියල් 5000/- යි.

### කාව්‍ය

'මුතු'; කර්තෘ: මර්සලින් ජයකොඩි පියතුමා - ත්‍යාගය රුපියල් 5000/- යි.

### ළමා සාහිත්‍ය කෘති

'පුංචි ළමයි': කර්තෘ: සුනිල් ජයවීර- ත්‍යාගය රුපියල් 2000/- යි

### පරිවර්තන

'හයේ වාට්ටුව සහ තුන් අවුරුද්ද': පරිවර්තනය; පද්ම හර්ෂ කුරණගේ - ත්‍යාගය රුපියල් 5000/- යි.

### විවිධ

'සිංහල නාට්‍යයේ විකාශනය'; කර්තෘ: ආචාර්ය තිස්ස කාරියවසම් - ත්‍යාගය රුපියල් 5000/- යි.

විද්‍යා ප්‍රබන්ධ, නාට්‍ය සහ කෙටිකතා යන විෂයයන්ගෙන් ත්‍යාග පිරි නැමීමට සුදුසු කෘති නොවූ හෙයින් ඒ සඳහා මෙවර ත්‍යාග පිරී නොනැමෙන බව සංස්කෘතික අමාත්‍යාංශය මගින් ප්‍රකාශයට පත් කර ඇත.

හොඳම කාව්‍යය සඳහා වන ත්‍යාගය පිරිනමන ලද්දේ හතරලියද්දේ විසූ ධර්මදස අමරතුංග මහතා සිහිවීම පිණිස සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් නලින් රත්නායක මහතා සහ එම මහත්මිය විසින් බවද සඳහන් වෙයි.

ත්‍යාග ප්‍රදානය පෙබරවාරි මස 15 වන දින ගලගෙදර ජ්. ඒ. නුගවෙල මධ්‍ය මහා විද්‍යාලයේදී පැවැති රාජ්‍ය සාහිත්‍ය උත්සවයේදී අග්‍රාමාත්‍ය ආර්. ප්‍රේමදාස මහතා අතින් සිදු කැරිණි.


## ප්‍රකාශන

### ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් ප්‍රකාශිත පොතපත

★ මහජන පුස්තකාල ප්‍රමිති

සංස්කරණය:

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

මිල රු. **4.00**

★ ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

වාර්ෂික දායක මුදල රු. **45.00** (තැ. ගා. සමග)

★ මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහය

**1978** දී මිල -රු. **12.00**

★ පුස්තකාල ප්‍රවෘත්ති

සිංහල - දෙමළ - ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්

ත්‍රෛමාසික ප්‍රකාශනය - නොමිලයේ සැපයේ

★ **Catalogue of Postgraduate Dissertations in the Libraries of Sri Lanka ( -- 2nd ed. in press )**

**Comp. by N. Amarasinghe (Unpriced)**

ලියුම්, මුදල් ඇණවුම් හෝ චෙක්පත් පහත ලිපිනයට:

**අධ්‍යක්ෂ,**

**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,**

නිදහස් මාවත, කොළඹ 7.

ටැලිපෝන්: 98847


ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් කොළඹ 2, ජස්ටිස් අක්බාර් මාවතේ වෙව් ප්‍රින්ට්ස් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.